# සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති රෝහල් සහ ආයතනවල කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ – 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරෙහි පවතින පුරප්පාඩු 64ක් සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අවශ්‍ය සුදුසුකම්

2.1. අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම්

| අධ්‍යාපන සුදුසුකම් | වෘත්තිය සුදුසුකම් |
|---|---|
| සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරකදී විෂයයන් හයකින් (06) අ.පො.ස.(සා/පෙළ) විභාගය සමත්ව තිබීම.<br>හෝ<br>ජාතික වෘත්තිය සුදුසුකම (NVQ) 03 ලබා තිබීම | 01.කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව යටතට ගැනෙන හෝ එම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත ආයතනයක් මඟින් පිරිනමනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම.<br>i. වසර 03ක අර්ධකාලීන ජාතික තාක්ෂණික සහතිකය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු) National Certificate in Technology (Electrical & Electronic Engineering)<br>ii. වසර 02ක පූර්ණකාලීන කර්මාන්ත තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය (විදුලි හා විද්‍යුත් ඉංජිනේරු) National Certificate in Industrial Technology (Electrical & Electronic Engineering)<br>iii. වසර 02ක පූර්ණකාලීන ජාතික ඩිප්ලෝමා (විදුලි තාක්ෂණය) සහතිකය National Diploma in Electrical Technology<br>iv. වසර 02ක පූර්ණකාලීන ජාතික ඩිප්ලෝමා (විද්‍යුත් තාක්ෂණය) සහතිකය National Certificate in Electrical Technology<br>හෝ<br>02.මොරටුව පිහිටි කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය (Industrial Engineering Training Institute) මඟින් පිරිනමනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම<br>i. ඉලෙක්ට්‍රොනික් කාර්මික ශිල්පී පාඨමාලාව (Electronics Craftsman)<br>ii. විදුලි කාර්මික ශිල්පී පාඨමාලාව (Electrician)<br>හෝ |

| | |
|---|---|
| | 03. තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාව යටතට ගැනෙන ආයතනයක් මගින් හෝ ආයතනය විසින් නිර්දේශිත ආයතනයක් මගින් පිරිනමනු ලබන ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) 05 මට්ටම ඇතුළත් පහත පාඨමාලාවලින් එකක් සම්පූර්ණ කර තිබීම<br><br>i. විද්‍යුත් තාක්ෂණය ජාතික ඩිප්ලෝමාව<br>National Diploma in Electrical Technology (Full Time)<br><br>ii. විද්‍යුත් තාක්ෂණ ඩිප්ලෝමාව<br>Diploma in Electrical Technology<br><br>iii. වසර 03ක විද්‍යුත් තාක්ෂණ ඩිප්ලෝමාව<br>Diploma in Electrical Technology (03 Years Part Time)<br><br>iv. විද්‍යුත් තාක්ෂණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව<br>Higher National Diploma in Electrical Technology<br><br>v. විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ජාතික සහතිකය<br>National Certificate in Electrical Technology (NCIT – Electrical)<br><br>vi. අර්ධකාලීන වසර 03ක විද්‍යුත් තාක්ෂණය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව<br>National Diploma in Electrical Technology (03 Years Part Time)<br><br>හෝ<br><br>04. ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය විසින් සහතික කරන ලද හෝ ඒ යටතේ පවතින ආයතනයක් විසින් ප්‍රධානය කරනු ලබන ජෛව වෛද්‍ය උපකරණ තාක්ෂණය (Bio Medical Equipment Technology) මට්ටම 06 සුදුසුකම් ලබා තිබීම.<br>හෝ<br>05. රජය විසින් පිරිනමනු ලබන විදුලි / විද්‍යුතය සම්බන්ධ ජාතික තාක්ෂණික සහතික පාඨමාලාවක් හදාරා 2015.11.17 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 22/2015 අනුව 1990.10.30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 VI සුදුසුකම් සම්පූර්ණ කර තිබීම. |

2.2. පළපුරුද්ද : විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරට අදාළව රාජ්‍ය හෝ පිළිගත හැකි ඕනෑම පෞද්ගලික අංශයේ ආයතනයක් මගින් ක්ෂේත්‍රය පිළිබඳව ලබා ඇති පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

2.3. කායික සුදුසුකම්: - සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

2.4. වෙනත්:

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය
II. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින්ද යුක්ත විය යුතුය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 2.1 සිට 2.5 දක්වා වූ සියලුම සුදුසුකම් 2026.10.12. දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

2.5. වයස:

I. අවම වයස් සීමාව : අවුරුදු 18ට නොඅඩු
II. උපරිම වයස් සීමාව : අවුරුදු 35ට නොවැඩි

03. බඳවා ගැනීමේ ක්‍රමය:

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 1. ලිඛිත විභාගය | විෂය නිර්දේශය පහත දැක්වේ. | | | |
| I. බුද්ධි පරීක්ෂණය | | පැය 01 | 100 | 50% |
| II. විෂයානු බද්ධ සාමාන්‍ය දැනුම | | පැය 01 | 100 | 50% |
| 2. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය | | පැය 02 | 100 | 50% |

| ප්‍රශ්න පත්‍රය | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලභාවයෙන්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන් තීරණය කිරීමේ ශක්තියත්, විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. |
| විෂයානු බද්ධ සාමාන්‍ය දැනුම | ධාරා විද්‍යුතය - සරල ධාරා විද්‍යුතය, ඕම්ගේ නියමය, කර්චෝෆ් නියමය, විභව අන්තරය, ධාරාව මැනීමේ ක්‍රම<br>චුම්භකත්වය - විද්‍යුත් චුම්බකත්වය<br>ස්ථිතික විද්‍යුතය - කූලෝම් නියමය<br>තරංග - විද්‍යුත් චුම්භක තරංග<br>ඉලෙක්ට්‍රෝනික භෞතික විද්‍යාව - අර්ධ සන්නායක ඩයෝඩ සහ ට්‍රාන්සිස්ටර්<br>තාපය - ප්‍රසාරණය, රේඛීය ප්‍රසාරණතා සංගුණකය<br>ගණිතය - ත්‍රිකෝණමිතික ශ්‍රිත, නිව්ටන් භෞතික විද්‍යාව<br>විදුලි යන්ත්‍ර - ( D.C මෝටර්, A.C මෝටර්, විදුලි පරිණාමක) |

| | |
|---|---|
| ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය | ක්ෂේත්‍රයට අදාළ මූලික දැනුම, උපකරණ සවි කිරීම, අලුත්වැඩියා කිරීම පිළිබඳ දැනුම, අදාළ ක්ෂේත්‍රයේ උපකරණවල දෝෂ හඳුනා ගැනීම, ක්ෂේත්‍රයට අදාළ උපකරණ භාවිතය පිළිබඳ දැනුම, එකලා මෝටර්, තෙකලා මෝටර්, සරල ධාරා මෝටර්, තෙකලා තාපන දඟර, ඔසිලස් කෝප් භාවිතය ස්ටාර් ඩෙල්ටා පරිපත, ජව සැපයුම් පරිපත පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම |

04. වැටුප් ව්‍යුහය හා වැටුප් පරිමාණය මාසික:

රුපියල් 50,090-10x540-10x630-11x1,010-10x1,190 -රු. 84,420

MT 1 (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 10/2025 උපලේඛන (II) අනුව)

05. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි

(i) බඳවා ගනු ලබන නිලධාරීන් දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කැමති විය යුතුය.

(ii) පත් කරනු ලබන තනතුර ස්ථිරය. තෝරාගත් අයදුම්කරුවන්ට හිමි විශ්‍රාම වැටුප් පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුවේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය විසින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතුය.

(iii) මෙම පත්වීම තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර බඳවා ගෙන වසර තුනක් (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020ට අනුව හා ඊට ආනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැදී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාව ලබාගත යුතුය.

(v) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, රජය විසින් නිකුත් කරන චක්‍රලේඛ විධිවිධානවලට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙ කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියට ද, සෞඛ්‍ය හා ජනමාධ්‍ය ලේකම් විසින් නිකුත් කරන චක්‍රලේඛ හා පොදු විධිවිධානවලට ද මෙම පත්වීම යටත් වේ.

(vi) ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

06. අයදුම් කළයුතු ක්‍රමය

(අ) අයදුම්කරුවන් මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙළ කර අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුර සඳහා බඳවා ගැනීම (විවෘත) - 2026" යනුවෙන් සඳහන් කර 2026. . ......... දිනට පෙර "ලේකම්, සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, පාලන 07 ශාඛාව, අංක 106, ඩඩ්ලි සේනානායක මාවත, කොළඹ 08" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(ආ) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය: 2026. . ...........

(ඇ) විභාග ගාස්තුව රු. 1000.00 කි. ලංකා බැංකුවේ තැප්‍රොබේන් ශාඛාවේ සෞඛ්‍ය ලේකම් නමින් ඇති ගිණුම් අංක 7041318 ගිණුමට බැරවන පරිදි මෙම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකට ගෙවා ලබාගත් රිසිට්පත ආදර්ශ අයදුම්පතෙහි දක්වා ඇති කොටුව තුළ නොගැළවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තු කුමන හේතුවක් නිසා හෝ ආපසු ගෙවීමක් හා වෙනත් විභාගයක් හෝ කරුණක් සඳහා වලංගු සේ සලකා කටයුතු කරනු නොලැබේ. තවද, අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවන ලද රිසිට්පතෙහි පිටපතක් ළඟ තබා ගැනීම සුදුසු ය. (මුදල් ඇනවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.)

(ඈ) අයදුම්පත පිළියෙළ කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

(ඉ) අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස් වීම් කිසිවක් පිළිබඳව සලකා බලනු නොලැබේ.

07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය

විභාග අපේක්ෂක / අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන කවර ලියවිල්ලක් හෝ භාර ගනු ලැබේ.

I. ජාතික හැඳුනුම්පත
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය
III. වලංගු ශ්‍රී ලාංකීය රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග ශාලාවට ඇතුළු වීමේ දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාව වෙත ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාවය සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාව වෙත ඇතුළත් කර නොගැනේ. තවද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනාගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය. ඊට අමතරව විභාගය සම්බන්ධයෙන් අවශ්‍ය විය හැකි වෙනත් උපදෙසක් වේනොත් ඒ බව විභාග ප්‍රවේශ පත්‍රය මඟින් ඔබට දන්වනු ලැබේ. විභාගය සම්බන්ධව වූ මෙම නියමයන්ට පටහැනිව කටයුතු කරන අයදුම්කරුවන් විභාග ශාලාව තුළට ඇතුළු කර නොගැනීම/විභාග ශාලාවෙන් ඉවත් කිරීමේ බලය විභාග ශාලාධිපති සතුවේ.

08. අත්සන සහතික කිරීම:

රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු හෝ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ /අධ්‍යාපන පරිපාලන සේවයේ /රජයේ ගණකාධිකාරී සේවයේ/ රු. 854,880/-කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් අයදුම්කරුගේ /අයදුම්කාරියගේ අත්සන සහතික කර තිබිය යුතුය.

09. සාවද්‍ය තොරතුරු සැපයීම.

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු සපයා ඇති යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව ඕනෑම අවස්ථාවකදී අනාවරණය වුවහොත් ඊට අදාළ නෛතික ක්‍රියා මාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

10. විභාග කොන්දේසි:-

(i) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් 2026. 10. 12. දිනට සම්පූර්ණ කර තිබිය යුතුය. නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් විභාගයෙන් ප්‍රමාණවත් ලකුණු මට්ටමක් ලැබුවද පත්වීම් ලැබීමට නුසුදුස්සෝ වෙති.

(ii) මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(iii) අයදුම්පත් ලැබුණු බව දන්වා එවනු නොලබන අතර ප්‍රමාදවී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

(iv) ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් තරඟ විභාගයට කැඳවනු ලබන අතර ඒ බව අයදුම්පතෙහි සඳහන් ලිපිනයට දැනුම් දෙනු ලැබේ.

(v) බඳවා ගැනීමේ තරඟ විභාගය, ලිඛිත විභාගය සහ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් සමන්විත වේ.

(vi) පළමුව ලිඛිත පරීක්ෂණය පවත්වන අතර ඉන් සමත් වන අයදුම් කරුවන් අතරින් ඔවුන් ලබා ගන්නා ලද ලකුණුවල කුසලතා අනුපිළිවෙළ අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාව මෙන් දෙගුණයක් ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයෙන් සමත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුවේ කුසලතා අනුපිළිවෙලට සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. ඒ අතරින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් තෝරාගනු ලබන අතර එසේ තෝරා ගන්නා ලද අයදුම්කරුවන් සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සහ ඒ යටතේ පවතින රෝහල් හා ආයතනවල පුරප්පාඩු සඳහා පත් කිරීමට නියමිතය.

(vii) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමති එක් භාෂා මාධ්‍යයකින් විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පමණක් පිළිතුරු දිය යුතුය.

**සැලකිය යුතුය:-**

(අ). අයදුම්පතේ සෑම වගන්තියක්ම සම්පූර්ණ කර ඇති බව හා එම තොරතුරුවල නිවැරදි බව පිළිබඳ සහතික විය යුතුය.

(ආ). අයදුම්පතට කිසියම් ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවල දී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂයකයාගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ. එසේ නොමැතිව අයදුම්පත්‍රයට කිසිසේත් සම්බන්ධ නොවන ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතුය.

(ඇ). අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ - හානි අයදුම්කරුවන් විසින්ම දරාගත යුතුය.

(ඈ). සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන සංඛ්‍යාව, තනතුරු සඳහා පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් තීරණය කරනු ලැබේ. කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම හෝ නොපිරවීමට පත්වීම් බලධරයාට බලය ඇත.

(ඉ). මෙම තනතුර සඳහා බඳවා ගැනීම් සම්බන්ධයෙන් මෙම ගැසට් නිවේදනයෙන් ආවරණය වන හෝ නොවන යම් කරුණක් සම්බන්ධයෙන් ගැටලු සහගත තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳව සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත. එසේම සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවක් හෝ පරස්පරතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
ලේකම්
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ,
ලේකම්,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය.

20.24.08. මස.26.වැනි දින,
සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය,
"සුවසිරිපාය",
අංක 385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.

සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි කළමනාකරණ සහකාර තාක්ෂණික බණ්ඩ - 03 සේවා ගණය විදුලි වෛද්‍ය යාන්ත්‍රික තනතුරේ III වන ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය: ☐
(සිංහල - S, දෙමළ - T, ඉංග්‍රීසි - E)
(අදාළ ඉංග්‍රීසි අක්ෂරය කොටුව තුළ ලියන්න)

ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : ☐

01.

(i) . මුලකුරු සමග නම :-

........................................................................................................................
(සිංහලෙන් / දෙමළෙන්)

(ii) සම්පූර්ණ නම:-

........................................................................................................................

........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

(iii) මුලකුරු සමඟ නම :- Mr./Mrs./Miss

........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා :- Mr./~~Mrs./Miss.~~ SILVA A.B.

(iv) සම්පූර්ණ නම :-

........................................................................................................................

........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

02. පදිංචි ලිපිනය

I. ස්ථිර පදිංචි ලිපිනය:-

........................................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

II. ස්ථිර පදිංචි ලිපිනය:-

........................................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්)

03. උපන් දිනය :-

| වර්ෂය | | | | මාසය | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

3.1 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :-

| වර්ෂය | | | මාසය | | | දිනය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | |

04. ජාතික හැඳුනුම්පත් අංකය :-.........................................................................

05 . දුරකථන අංකය : පෞද්ගලික (ජංගම):-................................... වට්ස්ඇප් :- ................................

06 . විද්‍යුත් ලිපිනය :- ........................................................................................................

07. ස්ත්‍රී / පුරුෂ භාවය :- ස්ත්‍රී ☐ පුරුෂ ☐

08 ශ්‍රී ලංකා පුරවැසියෙකුද යන්න බව :- ඔව් ☐ නැත ☐

09 විවාහක / අවිවාහක බව:-...........................................................................

10. .අධ්‍යාපන සුදුසුකම් :-

(අ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය:

වර්ෂය :-........... විභාග අංකය :-.......................

| අ/අ | විෂය | සාමාර්ථය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

(ඇ) වෘත්තීය හා කාර්මික සුදුසුකම් පිළිබඳ විස්තර

| සහතිකය | නිකුත් කළ ආයතනය | වර්ෂය | විෂයයන් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(වෘත්තීය හා කාර්මික සුදුසුකම්වලට අදාළ සහතික වල සහතික කරන ලද පිටපත් අමුණන්න.)

(ඇ) වෙනත් විශේෂ සුදුසුකම් හා පළපුරුද්ද:

.................................................................................................................................

.................................................................................................................................

11. සේවා ඉතිහාසය

I. මෙයට පෙර රාජ්‍ය සේවයේ තනතුරක් දරා තිබේද:-.......................................................

II. ඔව් නම් එම තනතුර :- ....................................................

III. සේවා ස්ථානය :- ....................................................

IV. පත්වීම් දිනය :- ....................................................

V. ඉවත් වූ දිනය :- ....................................................

VI. ඉවත් වීමට හේතුව :- ....................................................

12. ඔබ යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියකදී වරදකරු වී තිබේද?

(ඔව් නම් විස්තර සපයන්න):-

.................................................................................................................................

.................................................................................................................................

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :-

I. විභාග ගාස්තු ගෙවූ කාර්යාලය :-....................................................................................
II. ගෙවූ මුදල :-..............................................................................................................

| |
|---|
| ලංකා බැංකු ශාඛාවකට රු. 1000.00 මුදල ගෙවා ලබා ගත් රිසිට්පත නොගැළවෙන සේ මෙහි අලවන්න (අයදුම්පතෙහි සහ ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම මතු ප්‍රයෝජනවත් වනු ඇත.) |

14. අයදුම්කරුගේ සහතිකය:

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කරන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදි වූත් තොරතුරු බවට ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි ඇතුළත් යම් කිසි විස්තරයක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව සොයා ගනු ලැබුවහොත් එසේ සොයා ගන්නා ලද්දේ තෝරා ගැනීමට පෙර නම් එම අයදුම්පත අවලංගු වන බව ද, තෝරා ගැනීමෙන් පසුව නම් යම් කිසිම වන්දියක් නොමැතිව හා ඊට අදාළ නෛතික ක්‍රියාමාර්ගයන්ට යටත්ව මම සේවයෙන් පහකරනු ලබන බව ද පිළිගනිමි.

දිනය :-........................................ ........................................................

අයදුම්කරුගේ අත්සන

15. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු / ඇය මා ඉදිරිපිටදී......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

.....................................................................

සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන ලද නිලධාරියාගේ,
සම්පූර්ණ නම :-..................................................
තනතුර :-..................................................
ලිපිනය :-..................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

16. දැනට රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ කටයුතු කරන ගැසට් නිවේදනයේ දක්වා ඇති මූලික සුදුසුකම් සපුරා ඇති නිලධාරීන්ට පමණක් පහත කරුණු අදාළ වේ.

16.1 දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියා විසින් සම්පූර්ණ කළ යුතු විස්තරය

i. නිලධාරියාගේ නම :- ........................................................................
ii. ස්ථිර සේවා ස්ථානය හා ලිපිනය :-..........................................................
iii. ස්ථිර සේවා ස්ථානයේ දුරකථන අංකය :- ..................................................
iv. නිලධාරියාගේ ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................................
v. විභාගයට අයදුම්කරන අවස්ථාවේදී දරන තනතුර :- .......................................
vi. එම තනතුරට පත්වීම් ලැබූ දිනය :- ......................................................

vii. එම තනතුරේ ස්ථිර තිබේද? ("ඔව්" නම් ස්ථිර කරන ලද දිනය සඳහන් කරන්න)

.................................................................................................................................

viii. සේවා කාලය තුලදී විනයානුකූල දඬුවම් ලබා තිබේද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)

.................................................................................................................................

ix. මේ වන විට විනයානුකූලව දඬුවමකට යටත් කොට තිබේද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)

.................................................................................................................................

x. දැනට විනයානුකූල පරීක්ෂණ පැවැත්වෙන්නේද? ("ඔව්" ඒ පිළිබඳ විස්තර ඇතුළත් කරන්න)

.................................................................................................................................

මෙම අයදුම්කරු වන ......................................... මයා / මිය / මෙනවිය ආයතනයේ .......................... වැනි දින සිට .............................. (තනතුර සඳහන් කරන්න) සේවය කරයි. ඔහු/ඇය ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරයි. ඉහත 16 කරුණු යටතේ සඳහන් කර ඇති සියල්ල මෙම කාර්යාලයේ ඇති වාර්තා අනුව පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් ඔහු / ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරින් මුදා හරින / නොහරින බවත් මෙයින් සහතික කරමි.

.................................................................................

දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :- ...........................................................................
පදවි නාමය :- ..................................................................
දිනය :- ..........................................................................
දෙපාර්තමේන්තුව / ආයතනය :- ........................................
(රබර් මුද්‍රාවෙන් සනාථ කරන්න)